ක්‍රිස්තු ධර්මය - 11 ශ්‍රේණිය
තෙවන වාර පරීක්ෂණය - 2024

පිළිතුරු පත්‍රය
<u>1 කොටස</u>

| | | | |
|---|---|---|---|
| 1 - 1 | 11 - 2 | 21 - 3 | 31 - 1 |
| 2 - 3 | 12 - 4 | 22 - 4 | 32 - 3 |
| 3 - 2 | 13 - 1 | 23 - 1 | 33 - 2 |
| 4 - 4 | 14 - 3 | 24 - 2 | 34 - 3 |
| 5 - 4 | 15 - 2 | 25 - 1 | 35 - 2 |
| 6 - 1 | 16 - 3 | 26 - 1 | 36 - 4 |
| 7 - 1 | 17 - 4 | 27 - 1 | 37 - 1 |
| 8 - 4 | 18 - 2 | 28 - 4 | 38 - 2 |
| 9 - 9 | 19 - 2 | 29 - 3 | 39 - 4 |
| 10 - 1 | 20 - 4 | 30 - 2 | 40 - 1 |

**ක්‍රිස්තු ධර්මය - 11 ශ්‍රේණිය**
**තෙවන වාර පරීක්ෂණය - 2024**
**පිළිතුරු පත්‍රය - ll කොටස**

01)

I. මිනිසා විසින් දෙවියන් වහන්සේට ඉටු කළ යුතු පනත්
මිනිසා විසින් මිනිසාට ඉටු කළ යුතු පනත්

II. ආලේප කරනු ලැබූ තැනැත්තා

III. තම දරුවන් අහිමි වීම
තම සියලු දේපළ අහිමි වීම
තම බිරිඳ අහිමි වීම
මුළු ශරීරයේම කුෂ්ඨයක් ඇති වීම.

lV. ප්‍රේමය - ඉවසිලිවන්තය
කරුණාවන්තය
ඊර්ෂ්‍යාවන්තේ නැත
හරවටු කර ගන්නේ නැත
උඩඟු වන්නේ නැත
විනීත වේ
ආත්මාර්ථකාමී වේ
හනික නොකිපේ
නපුර සිතේ ධාරණය කර නොගනී
හරි දේ ගැන ප්‍රීති වේ
සියල්ල උසුලයි.

V. භාග්‍යවන්තයෝය
දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ගැන කියනු ලබන්නෝය

VI. මිදිවැල - ජේසුස් වහන්සේ
අතු - කිතුණු අය

VII. දෙවියන් වහන්සේගේ කැඳවීම තුළ දේවාත්මානුභාවයෙන් එළිදරව් කරන ලද දේව පණිවිඩය ජනතාවට පිළිගැන් වූ තැනැත්තා ය.

VIII. පෙන්තකොස්ත මංගල්‍යය

IX. ස්තේපන්,පිලිප්,ප්‍රොෙකාරස්,නිකනෝර්,තීමාන්,පර්මේනස්,නිකොලොස්

X. වැලි මත අත්තිවාරම් දැමීම
පර්වතය මත අත්තිවාරම් දැමීම

02)

I. පාවුලස්,සාවුල්

11. දමස්කයේ කිතුණුවන් අත්අඩංගුවට ගැනීම සඳහා සාවුල් දමස්කය බලා පිටත් වෙයි. ඒ යන අතරතුරදී ඔහුට මහත් වූ අත්දැකීමකට මුහුණ දීමට සිදුවේ. මහත් ආලෝකයක් ඔහුගේ ඉදිරියේ ආලෝකමත් වෙමින් අසනු ලැබුවේ

"සාවුල්.. සාවුල්.. ඔබ මට පීඩා කරන්නේ මන්ද" යනුවෙනි. "

" මම ඔබ විසින් පීඩා කරනු ලබන ජේසුස්" යන්න ආලෝකයන් ලැබූ පිළිතුර යි.

මේ මහා ආලෝකය නිසා සාවුල්ගේ ඇස් අන්ධ විය දින තුනක් ඔහු ඇස් නොපෙනී සිටියේය. ඔහුට ජේසුස් වහන්සේගෙන් ලැබුණු උපදෙස නම් නැගිට නුවරට ඇතුළු වන්න ඔබ කළ යුතු දේ ඔබට කියනු ලබන්නේ යන්නයි.

111. *. විවිධ තත්ත්වයන් තුළදී දෙවියන් වහන්සේ වෙනුවෙන් ක්‍රියා කිරීමට අපව තෝරා ගන්නා බව.

*.කිනම් තත්ත්වයකදී හෝ අවස්ථාවකදී වූවද අප කැඳවීමේ හඬට කීකරු විය යුතු බව.

*. අපගේ පෞද්ගලික තීරණවලට වඩා දෙවියන් වහන්සේගේ තීරණ ක්‍රියාත්මක වන බව.

*. අපගේ දැනුම ගැන ආඩම්බර නොවී ඒය දෙවියන් වහන්සේට මෙහෙයවීමට ඉඩ හැරීම.

*.ක්‍රිස්තුස් වහන්සේ තෝරා දෙන මාර්ගය පහසු නොවන අතර දුක් ගැහැට වලට ධෛර්යයෙන් යුතුව මුහුණ දීම.

*.දේව කැමැත්ත ඉටු කිරීමේදී මුහුණ දෙන අසීරු තාවලදී ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් ශක්තිය ලැබීම.

03)

l. දෙවියන් වහන්සේත් සමඟ ඇති සම්බන්ධතාවය දුර්වල වීම/අඩු බව

ll. ධනවත් ප්‍රධානියා
ධනවතා සහ ලාසරස්
සග සම්පත් (මෙලොව ඔබට වස්තුව රැස් කර

lll. දිළිඳු අයට ශක්තියක් වීම
අලසකමින් තොරව ක්‍රියා කිරීම
සම්පත් නිසි ලෙස බෙදීයාමට සැලැස්වීම
විනීත ලෙස හැසිරීම
ධනාත්මක ආකල්ප ඇති කර ගැනීම
ආත්මික ශක්තිමත් වීම
දිළිඳුකම අභයෝගයක් ලෙස භාර ගැනීම

04)

l. ඩුනෝටිස්
සේමෙයොන්

ll. 1 සුව කිරීම්
2 අශුද්ධාත්මක දුරු කිරීම්
3 ස්වභාව ධර්මය අභිබවා ක්‍රියා කිරීම්
4 මරණින් උත්ථාන කිරීම්

lll. 1 දේව බලය කෙරෙහි ඇඳහිල්ලන් විශ්වාසය තැබීම
2 කුඩා දෙයින් මහත් දෙයක් කිරීමට හැකි බව
3 ක්‍රමවත්ව හා පිළිවෙළක් ඇතිව කටයුතු කිරීම කළ යුතු බව
4 නිරතුරුව දෙවියන් වහන්සේට ස්තුතිය පුද කළ යුතු බව
5 අරපිරිමැස්මෙන් ක්‍රියා කිරීම ගැල වීම ක්‍රියා කළ යුතු බව

05)

l. 1 දේවාශිර්වාදයේ
2 ශාපලත් බව

ll.

- සියලු බාධක අභිබවා අන්‍යයන්ට යහපත සලසන ප්‍රේමයයි.
- මිතුරාට මෙන්ම සතුරාට ද ප්‍රේම කිරීමේ ප්‍රේමයක්
- දෙවියන් වහන්සේ අපට ප්‍රේම කළ මෙන් ප්‍රේමයකි.

lll.

- සමාජය සමඟ මුහු විය යුතුයි.

- ලුණු ආහාර රස ගන්වනවා සේ අපද අන් අයගේ ජීවිත රස ගන්වන්නට එනම් යහපතට ගෙනෙන්නට උත්සාහ කළ යුතුයි.
- අන් අයගේ ජීවිතවල තිබෙන පීඩා ඉවත් කිරීමට මැදිහත් විය යුතුයි.
- සමාජයේ තිබෙන නරක දේ ප්‍රතික්ෂේප කිරීමට වග බලා ගත යුතුයි.
- ආදර්ශමත් ජීවිතයක් ගත කළ යුතුයි.

අදාළ පිළිතුරු ඇත්නම් ලකුණු දෙන්න.

06)

l. වන පුවාම් පාවුළු පාප් වහන්සේ ගරු පීටර් ජෙරාඩ් සිල්වා දේවගැතිතුමා

ll. සත්වාර සැත්තෑවකි

- කමාව දීමට සීමාවක් නොමැති බව

lll

- කමාව දීමට අප ක්‍රියා කළ යුතු බව
- කමාව දීම දේව ගුණාංගයක් බව
- කමාව ඉල්ලීම
- කමාව අප කාටත් අවශ්‍ය බව
- කමාව දීමට හා කමාව ලැබීමට නැඹුර වන අප දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන බව
- කමාව දීම හා කමාව ලැබීම තුළ ජීවිතය අලුත් වීමකට පත් වන බව

07)

l. අන්තිම රාත්‍රී භෝජනය

පාස්කු නම් වූ නුමුහුන් රොටි මංගල්යය ජුදෙව්වරු වාර්ෂික ව අති විශේෂ ලෙස පැවැත්වූයේ දෙවියන් වහන්සේ විසින් ඊශ්‍රායල් ජනතාව මිසරයේ වහල් බවින් මුදවා ගනු ලැබූ අන්දම ස්තුතිවන්තව සිහිපත් කරනු පිණිසයි. එම මංගල්‍යය ජේසුස් වහන්සේ සහ ගෝලයන් දොළොස්දෙනා එකතුව ද පවත්වන ලදී. එහිදී ජේසුස් වහන්සේ රොටි සහ මිදි යුෂ වලට ආශිර්වාද කරන ලදී .ජේසුස් වහන්සේ රොටියක් ගෙන තුති පුදා "ඔබ උදෙසා දෙනු ලබන මාගේ ශරීරය මේය මා සිහි කිරීම පිණිස මෙය සිදු කරන්න" යැයි පැවසූ සේක. ඒ අතරම මිදි යුෂ කුසලානය ගෙන "මේ කුසලාන ඔබ උදෙසා වගුරුණු ලබන මාගේ රුධිරයෙන් කළ නව ගිවිසුමයි" වදාළ සේක. මෙහිදී ජේසුස් වහන්සේ ශුද්ධ වූ සහභාගීකමේ පිළිවෙත ස්ථාපිත කරන ලදී. මෙය නොකඩවා පවත්වන ලෙසද ජේසුතුමා අණ කළ සේක. එකම රොටිය බෙදා ගැනීම සහ එකම කුසලානයෙන් පානය කිරීමෙන් අපගේ සහෝදරත්වය සහ සමානාත්මතාවය මෙහිදී පෙන්නුම් කරනු ලබයි. මෙම පිළිවෙත ඉටු කිරීමෙන් අප උන්වහන්සේගේ දුක් විඳීමේ පංගුකාරකමට පත් වෙයි

11. ඔලීව කන්දේ යාඥාව

අන්තිම රාත්‍රී භෝජනයෙන් පසු ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් සමඟ ඔලීව කන්දට නැගුණු සේක. එහිදී ගෝලයන්ට යාඥා කිරීමට පවසා ජේසුස් වහන්සේ ද ඉදිරි සිදුවීම් ගැන යාඥා කළ සේක.මෙහිදී ජේසුස් වහන්සේගේ යාඥාව වූයේ "මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා " යන්නයි. මන්ද යත් ඉදිරියේ සිදුවන්නට යන සිදුවීම් දරන්නට අපහසු හෙයිනි.
ජේසුස් වහන්සේ කොපමණ වේදනාවෙන් සිටියද ගෝලයන් ඉදිකිරා වැටෙමින් සිටියහ. මෙය ජේසුස් වහන්සේ තවත් දුකට පත්කළ සේක. ජේසුස් වහන්සේ ගෝලයන්ට යාඥා කරන මෙන් ඉල්ලුවද ඔවුන් සිටියේ නිදා ගනිමිනි. එබැවින් ජේසුස් වහන්සේ ඔවුන්ගෙන් ඉල්ලුවේ "පරීක්ෂාවට නොවැටෙන පිණිස යාඥා කරන්න" යනුවෙනි. මුලීව කන්දේ යාඥාවේදී ජේසුස් වහන්සේ විසින් ගෝලයන්ගෙන් කරන ලද මෙම ඉල්ලීම අද අපගේ ජීවිතයටද පාඩමක් ගෙන දෙයි. අපගේ ජීවිතවලටද පැමිණෙන අභියෝගවලදී පරීක්ෂාවලදී යාඥාවෙන් ශක්තිමත් විය යුතු බව මෙහිදී අවධාරණය කරයි

III. රූප විපර්යාසය

මෙය අපගේ ජේසුස් වහන්සේගේ ජීවිතයේ ඉතා වැදගත් සිද්ධියකි. මන්ද යත් පියාණන් වහන්සේ, පුත්‍රයාණන් වහන්සේ හා ශුද්ධාත්මයාණන් වහන්සේ යන ත්‍රිත්වයම එක්වූ අවස්ථාවක් ලෙස මේය සඳහන් කළ හැකිය. මූලික ශ්‍රාවකයන් තිදෙනා වන පේදුරු, ජාකෝබ්, ජොහාන් යන ගෝලයන් මෙම අත්දැකීම ලබන ලදී. මෙහිදී සිදු වූ සිද්දීන් මෙසේ පෙන්වා දිය හැක.

ජේසුස් වහන්සේගේ මුහුණුවර වෙනස් වීම. වස්ත්‍ර ධවල කාන්තියෙන් බැබලීම. උන්වහන්සේගේ තේජස්ශ්‍රීය ප්‍රකාශිත සංකේතයන් ලෙස දැක්විය හැක.
දිවැසාවලියේ ප්‍රධානියා වන එළියාත්, ව්‍යවස්ථාවේ ප්‍රධානියා වන මෝසෙස් තුමාත් ජේසුස් වහන්සේ සමඟ දර්ශනය වීමෙන් කියවෙන්නේ එදින දිවැසාවලියත් ව්‍යවස්ථාවලියත් ජේසුස් වහන්සේ තුළ සම්පූර්ණ වූ ආකාරයයි. මොවුන් දෙදෙනා ජේසුස් වහන්සේ සමඟ කතා කරමින් සිටියේ උන්වහන්සේ ජෙරුසලමේ ඉටු කිරීමට යන ජීවිත පූජාව පිළිබඳවයි. වලා පටලය දර්ශනය වීමේ දර්ශනය වීමෙන් සංකේතවත් කරන්නේ දේව අභිමුඛත්වයයි. ඒමගින් ශ්‍රාවකයන්ට දෙවියන් වහන්සේගේ දේවත්වය වටහා ගැනීමට අවස්ථාව මින් ලැබිණි. දෙවියන් වහන්සේගේ හඬ මගින් මේය තවදුරටත් තහවුරු විය " මේ මාගේ ප්‍රියාදර පුත්‍රය අනුවය මේ මා තෝරා ගත් තැනැත්තානෝය මොහුට සවන් දෙන්න" යනුයි. කඳු මුදුනේ රැඳීමට ගෝලයන් විසින් කරන ආරාධනය ප්‍රතික්ෂේප කරන ජේසුස් වහන්සේ ගෝලයන්ව නිවැරදි මාවතට යොමු කරයි. ඇදහිල්ලෙන් ජේසුස් වහන්සේ අදහා ගැනීමට අප බැහැපත් විය යුතුවේ. ජීවමාන ජේසුස් වහන්සේ පිළිබඳ නිවැරදි දැක්ම තුළ අපගේ ජීවිත ආලෝකවත් වේ. එවිට උන්වහන්සේගේ අනුගාමිකයන් ලෙස අපට ලොවට ආදර්ශයක් විය හැකිය.

IV. එම්මාවුස් ගමන.

ක්ලෙයොපස් සහ තවත් ගෝලියෙකු ජෙරුසලමේ සිට එම්මාවුස් බලා පිටත් විය. එම ගමනේදී අමුත්තෙක් මගදී ඔවුන්ගේ ගමනට එකතු විය. එනම් ජීවමාන වූ ජේසුස් වහන්සේය. එම ගමන තුළදී ජේසුස් වහන්සේ ඔවුන්ගේ සිත් පැහැදෙන පරිදි කතා කළත් ඔවුන්ට ජේසුස් වහන්සේ හඳුනා ගත නොහැකි විය. එවිට ජීවමාන ජේසුස් වහන්සේ මෝසෙස් සහ සියලු දිවැසිවරුන්ගෙන් පටන්ගෙන තමන් වහන්සේ පිළිබඳව මුළු ශුද්ධ ලියවිල්ලේ සඳහන් කරුණු පහදා දුන් සේක.නමුත් උන්වහන්සේ ජේසුස් වහන්සේ බව ඔවුන්ට අවබෝධ වූයේ එදින රාත්‍රියේ කෑමට හිඳගත් කල රොටී ගෙන ආශිර්වාදය පවසා ඔවුන්ට දුන් අවස්ථාවේදීය. ඒ අන්තිම රාත්‍රී භෝජනයේදී උන්වහන්සේ රොටී කඩා ඔවුන් සමග බෙදා ගත් ආකාරය සිහි වීමෙන්ය. සැකය වියවුල තුළ ගමන් ගත් ශ්‍රාවකයින් දෙදෙන ජීවමාන දෙවියන් වහන්සේ සියැසින් දැක ඇදහිල්ලෙන් යුතුව ක්‍රියා කළහ. මෙලෙස අපටද ජේසුස් වහන්සේ නිරන්තරයෙන් අප අසලින් වැඩ සිටින නමුත්, අප සමග එක්ව ගමන් කරන්නා නමුත්,අපිට උන්වහන්සේ හඳුනා ගන්නට නොහැකි වේ.මන්දයත් උන්වහන්සේ ජීවමාන බව විශ්වාසය අප තුළ නොමැති හෙයිනි. අප බලාපොරොත්තු වන ස්රූපයෙන් හෝ බලාපොරොත්තු නොවන අවස්ථාවක උන්වහන්සේ හමු විය හැකිය. එබැවින් උන්වහන්සේ පිළිගැනීමට අප නිරතුරුව සූදානම්ව සිටිය යුතුය.

V. ජේසුස් වහන්සේගේ උත්ථානය

සතියේ පළමු වන දින හිමිදිරි උදෑසන කාන්තාවන් සුවඳ ද්‍රව්‍යය රැගෙන ජේසුස් වහන්සේ තැන්පත් කළ සොහොන වෙත පා නැගුවේ ජුදෙව් චාරිත්‍රයක් ලෙස මෘත දේහයට සුවඳ ද්‍රව්‍යය ආලේප කිරීම සඳහාය. සොහොන වෙත ළඟා වූ එම කාන්තාවන්ට දකින්නට ලැබුණේ හිස් වූ සොහොනකි. එතැනදී දර්ශනය වූ දේවදූතයන් විසින් පවසන ලද්දේ "ජීවමාන තැනන් වහන්සේ මළවුන් අතර සොයන්නේ මන්? උන්වහන්සේ මෙහි නැත. උන්වහන්සේ උත්තාන වූ සේක." යනුයි. කාන්තාවෝ තමන් ලද විශ්මිත අත්දැකීම පිළිබඳව ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් ඇතුළු සෙසු පිරිසට දැනුම් දෙමින් සත්‍යයට සාක්ෂි දැරූහ. ජේසුස් වහන්සේගේ පුනර්ජීවනය පිළිබඳව විශ්වාසය නොමැති සැම දෙනම සිදු කරන්නේද උන්වහන්සේ මළවුන් අතර සෙවීමය. සමහර කිතුනුවෝ පවා තම ජීවිත ප්‍රශ්න ගැටළු ඉදිරියේ ජේසුස් වහන්සේ කෙරෙහි ඉවත්ව වෙනත් විශ්වාස ඔස්සේ දිව යන්නේ ජේසුස් වහන්සේ ජීවමානව අප සමග වැඩ වසන දෙවිඳානන් බවට විශ්වාසයක් නොමැති නිසාය. මළ නමුත් උත්ථාන වී සදාකාලිකවම ජීවමානව අප සමග වැඩ සිටින ජේසුස් වහන්සේ කෙරෙහි අප විශ්වාසය තැබිය යුතු වේ. උන්වහන්සේ කෙරෙහි අපගේ ඇදහිල්ල වර්ධනය කරගත යුතුවේ.